**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - 2016**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහාවූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, අනාගත වගකීම් ඇතිවීමේ අවදානම අවම කර ගැනීම සඳහා විශ්‍රාමික පාරිතෝෂික බැඳියාව සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් ඇති කර ගැනීම ධෛර්යමත් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් හා සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගත් තත්ත්වයෙන් අසමත් බව තහවුරුවී තිබුණු ඖෂධවල පිරිවැය හා ඊට අදාළ විවිධ ගාස්තු අදාළ සැපයුම්කරුවන් වෙතින් අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ නිකුත් කර තිබුණු හරපත්‍රවල වටිනාකම් මුදල් පදනමට ගිණුම්ගත කර තිබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සැපයුම්කරුවන්ගෙන් අයවියයුතු රු.198,382,873 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) ඖෂධ නැව්ගත කිරීමට පෙර සිදු කරනු ලබන නියැදි පරීක්ෂාව වෙනුවෙන් දරන ලද වියදම් ගිවිසුම් ප්‍රකාරව සැපයුම්කරුවන්ගෙන් අයකරගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළදී ඒ වෙනුවෙන් දරන ලද රු.826,599ක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමකින් තොරව සංස්ථාවේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

#### 2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සමස්ත ණයගැතියන්ගෙන් සියයට 91.2ක් හෙවත් රු.5,771,132,176 ක් වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතුව තිබුණු නමුත් වෛද්‍ය සැපයීම් අංශයේ ගිණුම් වාර්තා අනුව එම ශේෂය රු.5,611,457,947 ක් විය. ශේෂ සැසඳුම් ප්‍රකාශ පිළියෙල කරමින් රු.159,674,229 ක් වූ වෙනසට හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට අපොහොසත්වී තිබුණි.

#### 2.2.4 පැහැදිළි නොකළ වෙනස්කම්

-------------------------------

සංස්ථාවේ පරිගණක අංශයෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව සහ භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව කල්ඉකුත්වූ ඖෂධවල වටිනාකමෙහි රු.153,719 ක වෙනසක් පැවතුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2016 දෙසැම්බර් 31 දිනට රු.523,256,337ක්වූ වෙළඳ ණයගිමි ශේෂයෙන් ණයහිමියන් 11කට අදාළ රු.1,860,427 ක ශේෂ තහවුරු කර ගැනීම සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය සැපයීම් අංශයෙන් ලැබිය යුතු රු.5,771,132,176 ක ශේෂයෙන් රු.211,810,803 ක් වර්ෂ 7 ත් වර්ෂ 18 ත් අතර කාලයක් පැරණි ණය ශේෂ වූ අතර රු.5,559,321,373 ක ණය සඳහා කාල විශ්ලේෂණය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සංස්ථාවේ ප්‍රතිපත්තිය අනුව, විකුණූ දින සිට දින 30 ත් දින 45 ත් අතර කාලය තුළදී වෙළඳ ණයගැතියන්ගේ ණය අයකරගත යුතු වුවද 2016 දෙසැම්බර් 31 දිනට වූ රු.552,045,880 ක ණය ශේෂයෙන් පුද්ගලික, රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් රු.13,343,931ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් රු.9,044,299 ක් වර්ෂයකට වැඩි කාලයක සිටද අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. ඉන් රු.10,440,049 ක ණය ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බව සංස්ථාවේ සභාපතිවරයා විසින් අදහස් දක්වා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රක්ෂණ වන්දි රු.3,947,890 ක් වූ අතර ඉන් රු.1,855,372 ක් වර්ෂ 2 ත් වර්ෂ 13 ත් අතර කාලයක සිට අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණු අතර රු.842,504 ක් අයකර ගත නොහැකි බව හඳුනාගෙන තිබුණු නමුත් එසේ වීමට හේතු සොයා බලා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට බහාලුම් තැන්පතු ගිණුමේ ශේෂය රු.10,333,759 ක් වූ අතර ඉන් රු.5,810,983 ක් වර්ෂ 2 ත් වර්ෂ 8 ත් අතර කාලයක සිට ආපසු අයකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

(ඉ) විදුලි ජනක යන්ත්‍රයක් අළුත්වැඩියා කිරීම සහ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පිළිවෙලින් 2013 සහ 2014 වර්ෂවලදී නිකුත්කරන ලද රු.105,672 ක සහ රු.150,000 ක අත්තිකාරම් හා 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ සැපයුම්කරුවන්ට නිකුත්කර තිබුණු රු.3,601,322 ක අත්තිකාරම් විගණිත දිනය වූ 2017 පෙබරවාරි 28 දින වන විටත් නිරවුල්කර නොතිබුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට බැංකු වෙත ගෙවිය යුතු බිල්පත් ගිණුමේ ශේෂය රු.1,849,474,481 ක් විය. ඉන් රු.30,779,344 ක් වර්ෂ 3 කට වඩා පැරණි සැපයුම්කරුවන්ට නොගෙවූ සියයට සියයක ණයවර ලිපි වටිනාකම හා රඳවුම් මුදල් වලින් සමන්විත වී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/57 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 25 කදී රු.100,000 ඉක්ම වූ එකතුව රු.7,334,250 ක්වූ ප්‍රදාන හා අනුග්‍රාහකත්ව දීමනා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව පෞද්ගලික ආයතන වෙත ගෙවා තිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 17 කදී නිකුත් කර තිබුණු එකතුව රු.264,285 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම දින 13ත් දින 195ත් අතර කාලයක් ප්‍රමාදවී පියවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,241,744,631 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.619,598,174ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයේ රු.622,146,457ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සෘජු වියදම් රු.6,487,187,300 කින් වැඩි වුවද විකුණුම් ආදායම රු.7,791,707,690 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩ ශුද්ධ ලාභයක් පෙන්නුම් කළද එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී සංස්ථාවේ 2012 වර්ෂයේදී රු.1,692,199,699 ක්වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.3,283,259,319 ක් දක්වා සියයට 6 සිට සියයට 31 අතර උච්චාවචනයන් සහිතව වර්ධනයවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 0.6කින් අඩුවී තිබුණු අතර ණයහිමි පිරිවැටුම් අනුපාතය වාර 15 කින් වැඩිවී ණය ගෙවීමේ කාලය දින 3 කින් අඩුවී තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කර ගත යුතු වන බව නිරීක්ෂණය විය.

## 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන හා නිළධාරීන් විසින් ටෙන්ඩර් පිරිනැමීමේ ක්‍රියාවලිය සම්බන්ධ මූලික අයිතිවාසිකම් කඩවීම, තනතුරින් පහත දැමීම, අසාධු ලේඛනගත කිරීම යන කරුණු මත සංස්ථාවට එරෙහිව අධිකරණවල නඩු 04 ක් ගොනුකර තිබුණු අතර ඉන් එක් නඩුවකට අදාළ වන්දි මුදල ඇමරිකානු ඩොලර් 948,759 ක් විය. සංස්ථාව විසින් බාහිර ආයතන 03 කට එරෙහිව එකතුව රු.7,862,551 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 03 ක් ගොනුකර තිබුණි.

## 3.4 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොලී වියදම පිළිවෙලින් රු.734,134 ක් හා රු.5,434,349 ක් වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එම වියදම සියයට 640කින් වැඩිවී තිබුණි. වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයුම් ප්‍රමාණය වැඩිවී තිබුණද, ඒ සඳහා මුදල් ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් බැංකු අයිරා පහසුකම් වැඩියෙන් ලබා ගැනීම ඊට හේතුවී තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 සැප්තැම්බර් 22 දිනැති අංක 14,976/8 දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව, ඖෂධ නිෂ්පාදනය, ස්වදේශීය නිෂ්පාදන මිළට ගැනීම, ආනයනය, අපනයනය, අලෙවි කිරීම, බෙදාහැරීම, සකස් කිරීම, ගබඩා කිරීම සහ ඇසිරීම යනාදී වූ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර තිබුණු නමුත් සියුම් රසායන ද්‍රව්‍ය නිපදවන කර්මාන්ත පිහිටුවීම හා ඒවාට අනුග්‍රහ දැක්වීම සහ ඖෂධ අලෙවිය පිළිබඳ ලංකාවේත්, විදේශ රටවලත් පර්යේෂණ කටයුතු ඇරඹීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණු රත්මලාන ප්‍රධාන ගබඩා පරිශ්‍රයේ ශීතාගාරයක් ස්ථාපිත කිරීම, ජීවනී නිෂ්පාදන අංශයට (ORS) ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා කොළඹ 07 ඔසුසල ඉදිකිරීම යන ක්‍රියාකාරකම් ආරම්භකර තිබුණු බැවින් හා ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකරගැනීමට සංස්ථාව අපොහොසත්ව තිබුණු බැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) ඖෂධ ආනයනයේදී අතරමැදියන් නොමැතිව ඍජු ආනයනය සඳහා ක්‍රමවේදයක් සැකසීම.
(ii) වාර්ෂිකව නව බෙදාහරින්නන් තිදෙනෙක් හඳුන්වාදීම.
(iii) සංස්ථාවේ සියළු මෙහෙයුම් අංශ සම්බන්ධීකරණය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ පද්ධතියෙහි (Enterprises Recourses Planning System) අවසන් ස්ථාපනය හා පද්ධති පුහුණුව යන අදියරයන් ක්‍රියාත්මක කිරීම.
(iv) නිෂ්පාදන සැලැස්ම සංවර්ධනය කිරීම හා නව නිෂ්පාදිත ඇතුළත් කිරීම.
(v) බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 සැප්තැම්බර් 19 වන දින සංස්ථාව විසින් බදුල්ල මහ නගර සභාව සහ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ඇති කරගත් බදු ගිවිසුමක් මඟින් බදුල්ල බස් නැවතුම්පල වෙළඳ සංකීර්ණයේ ඇති ගොඩනැගිල්ලක් බද්දට ගෙන රාජ්‍ය ඔසුසලක් ආරම්භ කර තිබුණද 2011 නොවැම්බර් 17 දින එම ඔසුසල එම ගොඩගිල්ලෙන් ඉවත්කර ගැනීමෙන් හිස්වූ ගොඩනැගිල්ල 2013 ජනවාරි 15 දින සිට පස් අවුරුදු කාලයකට මාසිකව රු.55,000 ක මුදලකට පුද්ගලයෙකුට බදුදී තිබුණි. ඒ සඳහා ඇතිකර ගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව බදු ගැණුම්කරු මාස 03 ක කාලයක් බදු මුදල් නොගෙවුවහොත් බදු ගිවිසුම අවලංගු කිරීමට බදු දීමනාකරුට අයිතිය පැවතුණද 2013 සැප්තැම්බර් 05 න් පසුව මාස 09 ක කාලයක් තිස්සේ බදු ගැණුම්කරු විසින් බදු මුදල් ගෙවීම පැහැර හැර තිබුණු නමුත් සංස්ථාව විසින් බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් කරන ලද දැනුවත්කිරීම් හේතුවෙන් බදු ගැණුම්කරු විසින් විටින් විට රු.1,890,000 ක් සඳහා චෙක්පත් සහ මුදල් ලබාදී තිබුණද ඉන් රු.1,330,000 ක් වටිනා චෙක්පත් අඟරු වී තිබුණි. 2017 මාර්තු 14 දින වන විට අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු මුළු හිඟ බදු මුදල රු.1,805,000 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී Omeprazole Capsules 20 mg ඖෂධයෙන් ඒකක 500,000ක් මිලදී ගැනීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) ඉදිරිපත් කර තිබුණු මිල ගණන් අනුව අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනෙකු අතරින් එක් අයෙකුට ඇණවුමෙන් සියයට 20 ක් පිරිනැමීමටත් ඉතිරි සියයට 80 ක ප්‍රමාණය තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු පෙර සැපයුම්කරුවෙකු වෙත පිරිනැමීමටත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. සංස්ථාව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන ලෙස ලංසුව පිරිනමා ඇති බව සමාන අවම මිල ඉදිරිපත් කර තිබුණු නමුත් ලංසුව හිමි නොවූ සමාගම විසින් චෝදනා කිරීමෙන් පසුව මුළු ඇණවුමෙන් සියයට 10 බැගින් අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනාට ලබාදීමට ප්‍රසම්පාදන කමිටුව යළි තීරණය කර තිබුණි. අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවන් දෙදෙනාට ඇණවුමෙන් සියයට 20 ක් පමණක් ලබාදීමටත්, ඉතිරි සියයට 80ම තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුට ලබා දීමටත් තීරණය කිරීමට පදනම් වූ පිළිගත හැකි කරුණු ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ දක්වා නොතිබුණි.

(ii) අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුවෙකුගෙන් ගෙන්වා තිබුණු ඒකක 50,000න් 47,684ක් ගුණත්වයෙන් අසමත්වීම හේතුවෙන් විකිණිය නොහැකි තත්ත්වයට පත්වී තිබුණු අතර ඉන් ඒකක 41,915 ක් ගබඩාවේ පැවති අතර ඉතිරි ඒකක 5,769 ක් රෝගීන්ට නිකුත් කර තිබුණි. අලාභය වූ රු.3,260,568 විගණිත දිනය වූ 2017 අප්‍රේල් 18 දින වන විටත් සැපයුම්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

(iii) මුළු ලංසුවේ ප්‍රමාණයෙන් සියයට 80ක ඇණවුම ලබා දුන් සැපයුම්කරු, 2015 නොවැම්බර් 19, 2015 නොවැම්බර් 24 හා 2017 පෙබරවාරි 08 දිනයන්හිදී පිළිවෙලින් ඒකක 125,000 ක්, 75,000 ක් හා 150,000 ක් බැගින් ඖෂධ ඒකක 350,000ක් සපයා තිබුණි. සැපයූ තොගය නිසි පරීක්ෂාවකින් තොරව භාරගැනීම හේතුවෙන් පාරිභෝගික පැමිණිල්ලක් මත සිදුකරන ලද පරීක්ෂාවකදී ඒකක 75,000ක් ලෙස සැපයූ තොගයේ ඒකක 62,697ක් ගුණත්වයෙන් අසමත් බව හඳුනාගෙන තිබුණු අතර ඒ වන විට ඒකක 12,303ක් රෝගීන්ට නිකුත් කර තිබුණි. කෙසේ වුවද ප්‍රතික්ෂේප කරන ලද තොගයේ අලාභය රු.5,063,410 ක් වූ අතර එය 2017 අගෝස්තු 01 දින වන විටත් සැපයුම්කරුගෙන් අයකරගෙන නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට මාර්ගස්ථ තොග ගිණුමේ කාල විශ්ලේෂණයට අනුව පිරිවැය රු.5,472,779 ක් වූ තොග මාස හයකට වඩා වැඩි කාලයක් ද, පිරිවැය රු.9,917,600 ක් වූ තොග වර්ෂයකට වඩා වැඩි කාලයක් ද මාර්ගස්ථ තොග ලෙස පවතින බව තහවුරු විය. වෛද්‍ය සැපයුම් අංශය විසින් භාරගත් තොග වෙනුවෙන් හරපත් නිකුත් කිරීමේ ප්‍රමාදය සහ වෛද්‍ය සැපයුම් අංශය භාර නොගත් තොග භාර නොගැනීමට හේතු සොයා බලා පිළියම් නොයෙදීම හේතුවෙන් එම තොග දීර්ඝ කාලයක් තිස්සේ මාර්ගස්ථ තොග ලෙස පැවතුණි.

(ආ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු නමුත් ඉකුත් වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් හා කල් ඉකුත්වූ ඖෂධවල මුළු පිරිවැය පිළිවෙලින් රු.25,579,947 ක් හා රු.21,257,018 ක්වූ අතර සමාලෝචිත වර්ෂයේදී තත්ත්වයෙන් අසමත් හා කල්ඉකුත්වූ ඖෂධවල පිරිවැය පිළිවෙලින් රු.110,007,776 ක් හා රු.19,980,259 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අලෙවියට නුසුදුසු බවට පත්වී තිබුණු එවැනි ඖෂධවල වටිනාකම සියයට 177 කින් වැඩිවී තිබුණි. 2015 හා 2016 වර්ෂයන්ට අදාළ තත්ත්වයෙන් අසමත් ඖෂධවල පිරිවැය රු.135,587,723 කින් රු.35,800,897 ක් 2017 අගෝස්තු 31 දින වන විටත් අයකරගෙන නොතිබුණු අතර ඖෂධ කල් ඉකුත්වීම නිසා සංස්ථාවට දැරීමට සිදුවී තිබුණු මුළු අලාභය රු.41,237,277 ක් විය.

(ඇ) සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු ඖෂධවලින් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.287,216,327 ක් වූ ඖෂධ විකිණිය නොහැකි තත්ත්වයට පත්වී තිබුණි. නමුත් භෞතික තොග සමීක්ෂණ වාර්තා අනුව එම තොගයේ පිරිවැය රු.258,125,317 ක් පමණක් වූයෙන් රු.29,091,010 ක වෙනසක් පැවතුණි. මෙම වෙනසින් රු.4,527,422 ක් සඳහා පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් කර තිබුණු නමුත් ඉතිරි රු.24,563,588 ක වෙනසට හේතු ඉදිරිපත් නොකෙරුණි. මේ අනුව හානිවූ තොග භෞතිකව නොපැවතීම තුළින් විකිණීමට නුසුදුසු තොග නැවත වෙළඳපලට නිකුත්වීමේ හැකියාවක් නොපවතින්නේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ පැවති ක්‍රියාකාරී ඔසුසල් 32න් ඔසුසල් 09 ක් අලාභ ලබා තිබුණු අතර මුළු අලාභය රු.12,196,684ක් විය. නමුත් අවිස්සාවේල්ල, මීනුවන්ගොඩ, දියතලාව, තංගල්ල, හම්බන්තොට හා යාපනය යන නගරවල පිහිටි ඔසුසල් 6 ක් 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මුළු අලාභයෙන් සියයට 88.2 ක් එම ඔසුසල් 6න් ලබා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දින වන විට තත්ත්වයෙන් අසමත්, හානිවූ හා ඌනතා ඖෂධ වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශය විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණු ඖෂධවල මුළු පිරිවැය රු.802,279,379 ක් විය. 2017 අගෝස්තු 01 දින වන විටත් ඉන් රු.759,329,236 ක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර ඒ තුළ වූ රු.186,488,579 ක් අසාධු ලේඛන ගත සැපයුම්කරුවන් ගෙන් අයකර ගත යුතු වූ බැවින් අයකිරීම් අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 6.3.6 ඡේදය ප්‍රකාරව, ලංසුකරුවන් විසින් ස්වකීය මිල ගණන් සංශෝධනය කරනු ලබන්නේ නම් ලංසු විවෘත කිරීමට පෙර තමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන මිල ගණන් එවිය හැකිවේ. ඒ බව ලංසු විවෘත කිරීම පිළිබඳ සටහනේ දැක්විය යුතු අතර ලංසු දැන්වීමේ දක්වා ඇති වේලාවට ලංසු විවෘත කිරීමෙන් පසු සුදුසුකම්ලත් සැපයුම්කරු තෝරා ගත යුතුවේ. නමුත් සමාලෝචිත වර්ෂයේදී Valgaciclorir ඖෂධයෙන් ඒකක 55,000 ක් මිලදී ගැනීම සඳහා ලද ලංසු විවෘත කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ලද රු.75,317,861 ක අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත ලංසුව ප්‍රදානය නොකර ලංසු විවෘත කිරීමෙන් දින 65 කට පසුව රු.80,921,214 ක සිට රු.69,325,634 ක් දක්වා මිල ගණන් සංශෝධනය කර තිබුණු ලංසුකරුවෙකු වෙත ලංසුව ප්‍රදානය කර තිබුණි.

(ආ) වෛද්‍ය සැපයීම් අංශය විසින් 2016 වර්ෂය වෙනුවෙන් Ultrasound Transmission gel ලීටර් 30,000ක් ඇණවුම් කර තිබියදී ලීටර් 50,000 ක් මිලදී ගෙන 2016 දෙසැම්බර් 16 දින වෛද්‍ය සැපයීම් අංශය වෙත යවා තිබුණි. ලීටර් 50,000 ක තොගය භාරදීමේ පත්‍රිකාවේ ලීටර් ප්‍රමාණය වැරදියට සටහන් කර තිබීම හේතුවෙන් මාස 04 කට අධික කාලයක් තොගය ලිඛිත බාරගැනීමකින් තොරව ගබඩාවේ රඳවා තබා තිබුණු අතර ඒ හේතුවෙන් රෝහල්වලට නිකුත් කිරීමට නොහැකිවී තිබුණි. මාස 36ක ජීවකාලය සහිතව වෛද්‍ය සැපයීම් අංශයට සැපයිය යුතු මෙම අයිතමයේ ජීව කාලය 2017 අප්‍රේල් 17 දින වන විටත් මාස 28 ක් දක්වා අඩුවී තිබුණි.

(ඇ) සංස්ථාවේ පරිගණක අංශයෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව, සංස්ථාවේ අලෙවිය සඳහා ගෙන්වන ලද ඖෂධවලින් සමාලෝචිත වර්ෂය තුළදී කල් ඉකුත්වූ ඖෂධ වටිනාකම රු.20,133,978 ක් විය. ඉන් රු.19,981,558 ක ඖෂධ කල් ඉකුත් වී තිබුණේ ලංසු ලියවිලිවල ඇතුළත් ගිවිසුම් කොන්දේසි 2.2 ප්‍රකාරව පැවතිය යුතු වර්ෂ 02 ක අවම ජීව කාලය රහිත ඖෂධ මිලදී ගැනීම හේතුවෙනි.

(ඈ) කොළඹ 07 ඔසුහලෙහි විදුලි සෝපානය සවි කිරීමේ කොන්ත්‍රාත්තුවේ පරිපාලන කටයුතු පිළිබඳ පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහතින් දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 ප්‍රකාරව, ලංසු ලේඛන පිළිවෙලින් තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් පරීක්ෂා කොට අනුමත කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ප්‍රකාරව, ජාතික තරඟකාරී ලංසු කැඳවීමකදී ලංසුකරුවන්ට තම ලංසු ඉදිරිපත් කිරීම සඳහා අවම වශයෙන් දින 21 ක කාලයක් ලබා දියයුතු වුවද මෙම කාර්යය සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 14 ක කාලයක් පමණක් ලබාදී තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කළයුතු අතර එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියළුම සාමාජිකයින් විසින් අත්සන් තැබිය යුතු නමුත් සංස්ථාව විසින් එසේ ලංසු විවෘත කිරීම පිළිබඳව සටහන් පවත්වා නොතිබුණි.

(iv) අදාල කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, 2015 අගෝස්තු 22 දින වන විට කොන්ත්‍රාත්තුවේ වැඩ නිම කළ යුතු වුවද විගණන දිනයවූ 2017 ජූලි 14 දින වන විටත් වැඩ නිමකරවා ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි.

**4.5** **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාවේ පුරප්පාඩු සේවක සංඛ්‍යාව 160 ක්වූ අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 06 ක් සඳහා නිලධාරීන් බඳවා ගෙන තිබුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විධායක මට්ටමේ තනතුරු 01 ක් හා විධායක නොවන මට්ටමේ තනතුරු 14 ක් සඳහා නිලධාරීන් 15 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත හා වැඩ ආවරණය කිරීමේ පදනම මත පත්කර තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයේ පවතින විධායක මට්ටමේ තනතුරක් වන කළමනාකරු (ප්‍රසම්පාදන) තනතුර සඳහා වර්ෂ 02 ක සිටද, අනුමත කාර්ය මණ්ඩලයේ නොපවතින කළමනාකරු (ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ) තනතුර සඳහා වර්ෂ 04 ක සිටද, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 02 දෙනෙකු බඳවාගෙන තිබුණි.

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුළත් කර තිබුණු සේවක බඳවාගැනීම් උසස්වීම් හා මාරුකිරීම්වලට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.2** **ප්‍රසම්පාදන සැලැස්ම**

සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගන්නා වෛද්‍ය සැපයුම් හා වෙනත් වත්කම් මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

**5.3** **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු සංශෝධිත අයවැය ලේඛනයට අනුව සමස්ථ වියදම් අයිතම 70කින් වියදම් අයිතම 26ක ඇස්තමේන්තු ගත හා තත්‍ය වියදම අතර සියයට 35 සිට සියයට 746 දක්වා විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන්හි දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ණය අයකර ගැනීම | හරපත් සඳහා මුදල් එකතු කර ගැනීම කාර්යක්ෂමව නොකිරීම. |
| (ආ) ඔසුසැල් පාලනය | අලාභයන්වලට හේතු සොයා බලා අලාභ අවම කර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබීම. |